ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
கமநல அபிவிருத்தித் திணைக்களம்
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

(111)

මගේ අංකය / எனது இல. / My No. 7/11/21(මැණික් බලපත්‍ර) ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2019.02.20

චක්‍රලේඛ අංක 24/2018 (සංශෝධන) I

සියලුම දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් හා ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන් වෙත,

**2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 32,33,34 හා 36 වගන්ති යටතේ කුඹුරු ඉඩම් වලින් ඛනිජ සම්පත් ලබා ගැනීමේ (මැණික් ගැරීම සඳහා පතල් කැනීම) කාර්යය වෙනුවෙන් කුඹුරු ඉඩම් යොදා ගැනීම සඳහා අවසර ලබා දීම.**

ශීර්ෂගත කරුණට අදාලව මගේ සමාංක හා **2018.11.08** දිනැති **24/2018** චක්‍රලේඛය හා බැදේ.

02. ඒ අනුව එකී චක්‍රලේඛයෙහි පහත දක්වා ඇති සංශෝධනයන් සිදු කරනු ලබන බව දන්වමි.

(I) එහි 2 වන ඡේදයේ අංක VI කොන්දේසිය වන "ඉඩම් හිමියා හෝ අඳ ගොවියා විසින් කුඹුරු ඉඩමේ ඉතිරි කොටස තුළ වී හෝ අනුමත කන්න භෝගයක් වගා කිරීමට අනිවාර්යයෙන් කටයුතු කල යුතුය" යන්න **"ඉඩම් හිමියා හෝ අඳ ගොවියා විසින් කුඹුරු ඉඩමේ ඉතිරි කොටස තුළ වී හෝ වෙනත් කෙටිකාලීන භෝගයක් වගා කිරීමට අනිවාර්යයෙන් කටයුතු කල යුතුය"** ලෙසද,

(II). එසේම 2 වන ඡේදයේ අංක XIV වන කොන්දේසිය වන "පතල් වැසීම තහවුරු කිරීම සඳහා රු.20,000.00 ක ආපසු ගෙවනු ලබන ඇපයක් ගොවිජන සේවා කාරක සභාවේ තැන්පත් කළ යුතුය" යන්න **"පතල් වැසීම තහවුරු කිරීම සඳහා රු.15,000.00 ක ආපසු ගෙවන ඇපයක් ගොවිජන සේවා කාරක සභාවේ තැන්පත් කළ යුතුය"** ලෙසද,

(III). එසේම 3 වන ඡේදයේ සඳහන් වන "බලය ලත් මිනින්දෝරුවරයෙකු විසින් පිළියෙල කරන ලද 1:1500 සිට 1:2500 අතර පරිමාණයේ පිඹුරුපතක් ඉදිරිපත් කළ යුතුය" යන්න **"අවසර ඉල්ලනු ලබන කුඹුරු ඉඩම, මුළු යාය සඳහා සකස් කර ඇති එක් පිඹුරුපතක් තුළ සටහන් වී ඇති අවස්ථාවලදී පමණක් ඒ සඳහා ගොවිජන සංවර්ධන නිලධාරි විසින් ඉදිරිපත් කරනු ලබන දළ සැලැස්ම යොදා ගත යුතු අතර අනෙක් සියලු අවස්ථාවලදී බලය ලත් මිනින්දෝරුවරයෙකු විසින් පිළියෙල කරන ලද 1:1500 සිට 1:2500 අතර පරිමාණයේ පිඹුරුපතක් ඉදිරිපත් කළ යුතුය"** ලෙසද,

(IV). එසේම 9 ඡේදයේ අංක XVII කොන්දේසිය වන "සාර්ථක ලෙස වී වගා කළ හැකි කුඹුරු ඉඩම්, සඳහා මේ යටතේ අවසර ලබා දීම සිදු නොකළ යුතුය" යන්න "සාර්ථක ලෙස වී වගා කළ හැකි කුඹුරු ඉඩම් සඳහා යාන්ත්‍රික පතල් කැනීමට අවසර ලබා දීම සිදු කරන්නේ නම් එම කාර්යය නිසා අවට ඇති කුඹුරු ඉඩම් වල වගා කටයුතු වලට බාධාවක් සිදු නොවන බවට ක්ෂේත්‍ර පරීක්ෂණයක් මගින් තහවුරු කර ගත යුතුය" ලෙසද වේ.

03. උක්ත සඳහන් සංශෝධන හැර මගේ සමාංක 7/11/21(මැණික් බලපත්‍ර) සහ 2018.11.08 දිනැති 24/2018 චක්‍රලේඛයේ වෙනත් කිසිදු කරුණක් හෝ කොන්දේසියක් මෙම ලිපිය මගින් සංශෝධනය නොවන බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ඩබ්.එම්.එම්.බී.වීරසේකර
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

ඩබ්.එම්.එම්.බී. වීරසේකර,
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්,
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 42, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

පිටපත්

1. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය
2. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
3. ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය
4. ලේකම්, මහවැලි හා පරිසර අමාත්‍යාංශය
5. රාජ්‍ය ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
6. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
7. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
8. අධ්‍යක්ෂ ජනරාල්, මහවැලි සංවර්ධන අධිකාරිය
9. සභාපති, මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
10. සභාපති, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධනය කිරීමේ සංස්ථාව
11. සභාපති, මධ්‍යම පරිසර අධිකාරිය
12. සභාපති, භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය
13. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත - මේ සම්බන්ධයෙන් සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීම සඳහා
14. සියලුම පළාත් කෘෂිකර්ම ලේකම්වරුන් වෙත
15. සියලුම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් වෙත
16. සියලුම පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂවරුන් වෙත
17. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් වෙත
18. සියලුම ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් වෙත

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
கமநல அபிவிருத்தித் திணைக்களம்
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | 7/11/21 (මැණික් බලපත්‍ර) | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2018.11.08 |

**චක්‍රලේඛ අංක: 24 / 2018**

සියලුම දිස්ත්‍රික්භාර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර
කොමසාරිස්වරුන් හා ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන් වෙත,

**2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 32,33,34 හා 36 වගන්ති යටතේ කුඹුරු ඉඩම් වලින් ඛණිජ සම්පත් ලබා ගැනීමේ (මැණික් ගැරීම සඳහා පතල් කැනීම) කාර්යය වෙනුවෙන් කුඹුරු ඉඩම් යොදා ගැනීම සඳහා අවසරය ලබා දීම.**

උක්ත කරුණට අදාලව නිකුත් කරන ලද අංක 21/2018 හා 2018.09.11 දිනැති චක්‍රලේඛය මෙයින් අවලංගු කරන අතර, ඒ වෙනුවට 24/2018 දරණ නව චක්‍රලේඛය අදාල කරගන්නා මෙන් කාරුණිකව දන්වමි.

02. 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 32,33,34 හා 36 වගන්ති අනුව කුඹුරු ඉඩම් වලින් ඛණිජ සම්පත් ලබා ගැනීම (මැණික් ගැරීම සඳහා පතල් කැනීම) සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අවසරය ලබා දීමේ දී පහත පියවරයන් අනුගමනය කළ යුතුය.

I. කුඹුරු ඉඩම්වල මැණික් ගැරීම සඳහා පතල් කැනීමේදී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අවසර ලබාදීම සඳහා වන GM – 1 අයදුම්පත්‍රය (ඇමුණුම - 1) ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් නොමිලේ නිකුත් කළ යුතු අතර, සම්පූර්ණ කරන ලද අයදුම්පත ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී වෙත ලැබුණු දින සිට උපරිම සති 3ක කාලයක් තුළ දිස්ත්‍රික්භාර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරයාගේ අවසරය පිළිබඳ තීරණය අයදුම්කරු වෙත ලබා දීමට උත්සහ කළ යුතුය.

II. මැණික් ගැරීම සඳහා පතල් කැපීමට එක් වරකට අවසර ලබාදිය හැකි කුඹුරු ඉඩමේ බිම් ප්‍රමාණය පර්චස් 20 විය යුතු අතර එම ඉඩම තුළ එක් වරක දී එක් අයදුම්කරුවකු විසින් ආරම්භ කළ හැකි උපරිම පතල් සංඛ්‍යාව පහකට (05) නොවැඩි විය යුතු ය.

III. මේ සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අවසරය ලබා දීම සඳහා පළමු මැණික් පතල වෙනුවෙන් අදාළ ගොවිජන සේවා කාරක සභාව වෙත රුපියල් 5000.00 ක සේවා ගාස්තුවක් අයදුම්කරු විසින් ගෙවිය යුතු ය.

IV. අමතර පතල් සඳහා අවසරය ලබා දෙන්නේ නම්, අමතර එක් පතලකට රුපියල් 2500.00 බැගින් ගොවිජන සේවා කාරක සභාව වෙත අයකළ යුතු අතර, පර්චස් 20 සීමාව තුල අවසර ලබා දිය හැකි උපරිම පතල් සංඛ්‍යාව 5 කි. ඒ අනුව අය කළ හැකි උපරිම සේවා ගාස්තුව රුපියල් 15000.00 කි.



ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ. පෙ. 537, කොළඹ 07.
கமநல அபிவிருத்தித் திணைக்களம், இல. 42, சேர் மார்கஸ் பெர்னாந்து மாவத்தை, அ. பெ. 537, கொழும்பு 07.
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT, NO. 42, SIR MARCUS FERNANDO MAWATHA, P. O. BOX 537, COLOMBO 07.
දුරකථන/தொலைபேசிகள்/Telephones :
පොදු කාර්යාලය / பொது அலுவலகம் / General Office: 2694231, 2694232, 2694233, 2694234
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් / கமநல அபிவிருத்தி ஆணையாளர் நாயகம் / Commissioner General of Agrarian Development: 2691060
ෆැක්ස් / தொலை நகல் / Fax: 2693572, 2691843, 2674481
E-mail : commissionerdad@yahoo.com
විදුලි පණිවුඩ / தந்தி / Telegram: ගොවිජනසේවා / கொவிசேவா / Agraservis

V. අදාල කුඹුරු ඉඩමට අඳ ගොවියකු සිටී නම් ඔහුගේ එකඟතාව ලිඛිතව ගත යුතු ය.

VI. ඉඩම් හිමියා හෝ අඳ ගොවියා විසින් කුඹුරු ඉඩමේ ඉතිරි කොටස තුළ වී හෝ අනුමත කන්න භෝගයක් වගා කිරීමට අනිවාර්යයෙන් කටයුතු කල යුතුය.

VII. අඳ ගොවියා සිය කැමැත්ත ලබාදීම ප්‍රතික්ෂේප කරන්නේ නම් 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 36 (1), (2), (3) වගන්ති ප්‍රකාරව අඳ ගොවියාට සන්තකය අහිමි වන කාලය සඳහා අයදුම්කරු විසින් අඳ ගොවියාට සුදුසු වන්දිය ගෙවිය යුතු අතර, අඳ ගොවියා විසින් එසේ ලබා දෙනු ලබන වන්දි මුදල පිළිබඳව සෑහීමකට පත් නොවන අවස්ථාවලදී ඒ පිළිබඳව තීරණය කිරීම සඳහා 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 36(2) වගන්තිය යටතේ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා සතු බලතල මේ මඟින් දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරුන් වෙත පැවරේ.

VIII. අඳ ගොවියා විසින් වන්දිය ප්‍රතික්ෂේප කලහොත් එම වන්දිය ගොවිජන සේවා කාරක සභාවේ තැන්පත් කළ යුතු අතර, එම මුදල ලබා ගන්නා ලෙස අදාල අඳ ගොවියාට ලියාපදිංචි තැපැලෙන් දැනුම් දීමට ගොවිජන සේවා කාරක සභාව විසින් ක්‍රියා කළ යුතුය.

IX. මෙම වන්දි මුදල මාස 6 ක කාලයක් තුළ අඳ ගොවියා විසින් ලබා නොගතහොත් දෙවන වරටත් අඳ ගොවියා වෙත ලියාපදිංචි තැපැලෙන් දැනුම්දීමෙන් අනතුරුව ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි විසින් එම මුදල ගොවිජන සංවර්ධන අරමුදලට බැර කළ යුතුය.

X. පළමු වරට ලබා දෙනු ලබන අවසරය මාස 12 ක කාලයක් සඳහා පමණක් වලංගු විය යුතු ය.

XI. නිර්දේශිත කාල සීමාව දීර්ඝ කරගැනීමට අයදුම්කරු අදහස් කරන්නේ නම් ඒ සඳහා අදාළ ගොවි සංවිධානයේ අදාල වසම භාර කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරයාගේ සහ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීවරයාගේ නිර්දේශය ලබා ගත යුතු අතර, පළමු බලපත්‍රයේ කාලය ඉකුත්වීමට අවම වශයෙන් සති 4 ක කාලයකට පෙර අදාල ඉල්ලීම ඉදිරිපත් කිරීමට අයදුම්කරු ක්‍රියාකල යුතුය.

XII. බලපත්‍රයේ කාලය දීර්ඝ කිරීමේ දි අදාල ඉල්ලීම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලැබී සති 03 ක කාලයක් තුළ බලපත්‍ර කාලය දීර්ඝ කර දීමට උත්සහ කළ යුතුවේ. දීර්ඝ කරන උපරිම කාලය ද මාස 12 ක කාලයක් සඳහා විය යුතු ය.

XIII. එක් ඉල්ලුම් පත්‍රයක් වෙනුවෙන් එවර ද රුපියල් 5000.00 ක සේවා ගාස්තුවක් අයදුම්කරු විසින් ගොවිජන සේවා කාරක සභාවට ගෙවිය යුතු ය.

XIV. පතල් වැසීම තහවුරු කිරීම සඳහා රු.20 000.00 ක ආපසු ගෙවනු ලබන ඇපයක් ගොවිජන සේවා කාරක සභාවේ තැන්පත් කල යුතුය.

XV. අවසරය ලබා දීමේ දී වගා කර ඇති කුඹුරු ඉඩමක පවතින වගාව ඉවත් කොට මැණික් ගැරීමට අවසරය ලබා නොදිය යුතු අතර, එම අවසරය ලබා දිය හැක්කේ, පවතින වගාව අවසන් වී අස්වැන්න ලබා ගැනීමෙන් අනතුරුව පමණි.

03. අවසරය ඉල්ලා සිටිනු ලබන පර්: 20 බිම් කොටස ඉඩමේ කුමන ස්ථානයේ පවතී ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් දළ සටහනක් මඟින්, පෙන්වා දිය යුතු ය. මෙම පර්: 20 බිම් කොටස් දැක්වීමට බලයලත් මිනින්දෝරුවරයෙකු විසින් අඳින ලද මානක සැලැස්මක් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන නමුත් අදාල ඉඩම හඳුනා ගැනීම සඳහා බලය ලත් මිනින්දෝරුවරයෙකු විසින් පිළියෙල කරන ලද 1:1500 සිට 1:2500 අතර පරිමාණයේ පිඹුරු පතක් ඉදිරිපත් කළ යුතු වේ. එසේම එම ඉඩම තුළ පිහිටා ඇති හෝ ඉඩමට මායිම් වී ඇති ජල මූලාශ්‍ර තිබේනම්, අදාල පිඹුරේ ඒවා සටහන් කර තිබීම අත්‍යාවශ්‍ය වනු ඇත. යම් හෙයකින් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් විසින් අවසර ලබා දෙනු ලබන පර්: 20 බිම් කොටස

107

වෙනස් කිරීමට අවශ්‍ය වන්නේ නම්, අයදුම්කරු විසින් ඒ සඳහා ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

04. කුඹුරු ඉඩමක පතල් කැනීම නිසා අවට වගාවන්ට, ඇළ මාර්ග වලට, අමුණුවලට, යාබද කුඹුරු වගාවන් වලට හෝ අනෙකුත් ජල මූලාශ්‍ර වලට හානියක් වන්නේ නම් එම කුඹුරු ඉඩම්වල මැණික් ගැරීම සඳහා පතල් කැපීමට අවසරය ලබා නොදිය යුතු ය.

05. නිර්දේශ කිරීමේ දී අයදුම්කරුගේ ඉඩම් අයිතිය පිළිබඳ තහවුරුවක් ලබා ගත යුතු ය. කිසියම් අයදුම්කරුවකුට අවසරය ලබාදීමට එරෙහිව තවත් පාර්ශවයක් විසින් පැමිණිලි කරන්නේ නම්, දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරයා විසින් පරීක්ෂණයක් සිදු කර තීරණයක් ලබා දිය යුතුය. මෙහි දී විරෝධතාව ඉදිරිපත් වී ඇත්තේ ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් නම්, ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරයා විසින් මේ සම්බන්ධයෙන් ඊට අදාල ගැටළුව සුදුසු අධිකරණයක් වෙත යොමු කිරීමට දින 60 ක කාලයක් මුලින් විරෝධත්වය ඉදිරිපත් කළ තැනැත්තා වෙත ලබා දිය යුතු වේ. ඉඩම් අයිතිය පිළිබඳව විරෝධතාවයන් ඉදිරිපත්වී දින 60 ක් ඇතුළත අදාල ගැටළුව සුදුසු අධිකරණයක් වෙත ඉදිරිපත් කිරීමට විරෝධතාකරු අසමත් වන්නේ නම් එවැනි ගැටළුවක් නොතිබූ සේ සලකා අයදුම්කරු වෙත අවසරය ලබා දීම සලකා බැලීමට දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරුන් ක්‍රියා කල යුතු වේ.

06. පතල් කැනීමෙන් ඉවත් කරන ජලය අනෙක් වගාවන් වලට හා වාරිමාර්ග වලට හානි නොවන සේ ඉවත් කළ යුතුය. පතලින් ජලය ඉවත් කිරීමේ දී අනෙකුත් කුඹුරු ඉඩම්වල ජලය සිඳී යන්නේ නම්, වහාම පතලින් ජලය ඉවත් කිරීම අත්හිටුවිය යුතුය. එසේම අදාල ඉඩමෙන් වෙනත් ඉඩම් වලට දෝනා කැපීම සිදු නොකළ යුතු අතර, මැණික් ගැරීමෙන් පසු නැවත පතල වැසීමේ දී ඉවත් කරන ලද පස් තට්ටුව අතුරා කුඹුරු ඉඩම නැවත වගා කළ හැකිවන සේ යථා තත්ත්වයට පත් කළ යුතුය. පතල් බලපත්‍රකරු මෙම කොන්දේසි ඉටු කිරීම හිතාමතාම මග හරි නම් ඒ බව මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත ලිඛිතව වාර්තා කොට, ඔහු ලවා කුඹුර යථා තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු වේ.

07. කුඹුරු ඉඩමක යන්ත්‍ර සූත්‍ර යොදා පතල් කැනීම (යාන්ත්‍රික පතල් කැනීම) සඳහා ඇමුණුම 02 හි GM - 02 අයදුම් පත්‍රය මඟින් අවසර ඉල්ලීම සිදු කල යුතුය.

08. ඉල්ලුම්කරු විසින් තමන්ගේ ඉල්ලීම දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් වෙත යොමු කළ යුතු අතර, අදාළ අවසරය ලබා දීම සඳහා පහත නිලධාරීන්ගේ නිර්දේශ ලබා ගත යුතුය.

1. ගොවි සංවිධානය
2. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර
3. ගොවිජන සංවර්ධන තාක්ෂණ නිලධාරී
4. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී

09. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී වෙත ඉල්ලීම ලැබී සති 03 ක කාලයක් තුළ නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් විසින් තමන්ගේ අවසරය පහත කොන්දේසි වලට යටත්ව අයදුම්කරු වෙත ලබා දීමට උත්සහ කළ යුතුය.

<u>කොන්දේසි</u>

I. අවසර ලබාදිය යුත්තේ එක් වරකට පර්: 20 ක් සඳහා පමණි.
II. එම අවසරය මාස 12 ක කාලයක් සඳහා වලංගු විය යුතුය.
III. රුපියල් 5000/= ක සේවා ගාස්තුවක් ගොවිජන සේවා කාරක සභාවට ගෙවිය යුතු අතර, ආපසු ගෙවනු ලබන රුපියල් 250,000/= රුඳවුම් මුදලක් ගොවිජන සේවා කාරක සභාවෙහි තැන්පත් කළ යුතුය. එම 250,000/= මුදල, කුඹුර යථා තත්ත්වයට පත්කර ඊලඟ කන්නය වගා කිරීමෙන් අනතුරුව නිදහස් කිරීමට කටයුතු කළ යුතු ය.

IV. අනුමැතිය ලබාදීමට පෙර යන්ත්‍ර සූත්‍ර කුඹුරු ඉඩමට ඇතුළු නොකළ යුතු ය.

V. අවසර ලබා දෙන කාල සීමාව ඉකුත් වූ වහාම සියළුම යන්ත්‍ර සූත්‍ර විෂයගත කුඹුරු ඉඩමෙන් ඉවත් කළ යුතු ය.

VI. පර්චස් 20 ක ප්‍රමාණය තුළ පමණක් යන්ත්‍ර යෙදවීම සිදුකළ යුතු ය.

VII. ජලය ඉවත් කිරීම සඳහා ඩ්‍රෙජර් යන්ත්‍ර, සකර් යන්ත්‍රය හැර ජල පොම්ප භාවිතය පමණක් සිදුකළ යුතු ය.

VIII. නියං කාලවල දී ගොවිජන සංවර්ධන තාක්ෂණ නිලධාරීගේ උපදෙස් අනුව පතලෙන් ඉවත් කරන මඩ වලින් තොර පිරිසිදු ජලය පමණක් වාරි ඇල මාර්ග වලට මුදා හැරීම සිදුකල හැකිය.

IX. පතල් කැපීමේ දී ඉවත් කරන මතුපිට පස් තට්ටුව කුඹුර සකස් කිරීමේ දී නැවත එම ඉඩමේ පතල් කැනීම සිදු කළ ස්ථානයේ මතුපිට නිසි පරිදි තැන්පත් කළ යුතු ය.

X. භූගත ජලය ඉවත් කිරීමේ දී අනෙකුත් යාබද ඉඩම් වලට හෝ ඒ මත ඇති ගොඩනැගිලි ආදියට හානි විය හැකි පරිදි ජලය සිඳීම සිදුවන්නේ නම් වහාම පතලෙන් ජලය ඉවත් කිරීම නතර කළ යුතු ය.

XI. රොන් මඩ ඉවත් කිරීමේ දී අවට ඇති කුඹුරු වලට හෝ වාරි මාර්ග වලට හෝ වෙනත් ජල මූලාශ්‍ර වලට හානි නොවිය යුතු ය.

XII. අපිරිසිදු ජලය මුදා හැරීමේ දී වෙනම වළකට බැහැර කර පසුව මඩ තැන්පත් වූ පසු පරිසරයට මුදා හැරිය යුතු ය.

XIII. යන්ත්‍ර ප්‍රවාහනයේ දී කුඹුරු වලට, වාරි මාර්ග වලට, ජලමූලාශ්‍ර වලට හෝ අවට ඉඩම් වලට හානි නොවිය යුතු ය.

XIV. පතල් කැපීමෙන් පසු කුඹුර නැවත වී වගා කළ හැකි වන සේ යථා තත්ත්වයට පත් කළ යුතුය.

XV. පතල් කැනීම් සිදුකිරීමේ දී වාරිමාර්ග වලට හානි සිදුවුවහොත්, එම වාරි මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ තාක්ෂණ නිලධාරීගේ අධීක්ෂණය යටතේ අදාළ බලපත්‍රකරු විසින් සිදුකළ යුතු ය.

XVI. පර්: 20 ක ඉඩමක් සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථානයට තැන්පත් කළයුතු මුදල රු: 250,000.00 ක් වන අතර, කුඹුර යථා තත්ත්වයට පත්කර ඉදිරි කන්නය වගා කිරීමෙන් අනතුරුව ( වී හෝ කන්න බෝග ) ඇප මුදල නිදහස් කිරීමට කටයුතු සිදුකළ යුතු ය. එසේම, මෙම පතල් කැපීම නිසා යාබද වාරිමාර්ග හෝ ජල මූලාශ්‍ර වලට හානි සිදු නොවූ බවට මෙම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ නිලධාරියකු විසින් සහතික කල යුතු අතර, එසේ හානි සිදු වී තිබේ නම්, ඇප මුදල් නිදහස් කිරීමට පෙර හානි වූ වාරිමාර්ගය හෝ ජල මූලාශ්‍රය අයදුම්කරු ලවා නිසි පරිදි පිළිසකර කරගත යුතුය. එසේම, වාර්මාර්ග හෝ ජල මූලාශ්‍ර වලට අලාභ හානි සිදුකිරීම ගොවිජන සංවර්ධන පනතට අනුව නීතියෙන් දඬුවම් ලැබිය හැකි වරදක් බව ද අයදුම්කරුට වටහා දිය යුතුය.

XVII. සාර්ථක ලෙස වී වගා කළ හැකි කුඹුරු ඉඩම්, සඳහා මේ යටතේ අවසර ලබා දීම සිදු නොකළ යුතුය.

10. යෝජිත පතල් කැනීම නිසා පවතින හෝ යෝජිත ජල මූලාශ්‍රයකට හානි පැමිණිය හැකි බව පෙනී යන අනතුරුදායක අවස්ථාවලදී, ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය ඉංජිනේරුවරයාගේ නිර්දේශය මත මෙම මුදල උපරිමය රු.500,000.00 දක්වා ඉහළ දැමීමට දිස්ත්‍රික්භාර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරයාට මෙයින් බලතල පැවරේ.

11. ඉහත සඳහන් කොන්දේසිවලට යටත්ව 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 32,33,34 හා 36 වගන්ති යටතේ කුඹුරු ඉඩම් කෘෂිකාර්මික නොවන කටයුත්තක් වන ඛණිජ සම්පත් ලබා ගැනීම සඳහා අවසර ලබා දීමට ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා සතු බලතල මෙයින් දිස්ත්‍රික්

ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරයා වෙත පැවරෙන අතර, මේ යටතේ අවසර ලබා දීමට ඇමුණුම -2 (ආකෘති GM – 02) යොදාගත යුතුවේ. එසේම අවශ්‍ය අවස්ථා වලදී මෙම GM – 02 ආකෘතිය එක් එක් විශේෂිත වූ අවශ්‍යතාවයකට ගැලපෙන පරිදි සංශෝධනය කර ගැනීම දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් වරයා විසින් සිදුකර ගතයුතු වේ.

12. එසේම මේ යටතේ දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරයා විසින් ලබා දෙනු ලබන තීන්දුව පිළිබඳව සෑහීමකට පත් විය නොහැකි පුද්ගලයින්ට ඒ පිළිබඳව වන අභියාචනයක් අදාල ලිඛිත සාක්ෂි සමඟින්, තීන්දුව ලැබී දින 60 ක් ඇතුලත තීන්දුව, ලබාදුන් දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරයා හා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට ද පිටපතක් සහිතව, ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, කරුණු සොයා බැලීමෙන් අනතුරුව ඒ පිළිබඳව සාධාරණ හා යුක්ති සහගත තීරණයක් ලබා දීමට ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා විසින් ක්‍රියා කරනු ඇත.

13. එසේම, අවශ්‍ය යැයි හැඟී යන අවස්ථාවලදී ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයාට මෙම බලතල තමා විසින් සෘජුවම ක්‍රියාවේ යෙදවීමට මෙම චක්‍රලේඛය බාධාවක් නොවන බව ද වැඩි දුරටත් සඳහන් කරමි.

14. මෙරටේ කුඹුරු ඉඩම් ද රැකගනිමින්, භූමිය තුල සැඟවී පවතින ස්වාභාවික සම්පත් වලින් ප්‍රයෝජනය ගැනීමට අවශ්‍ය නෛතික හා පරිපාලනමය රාමුව සකස් කිරීම මෙම චක්‍රලේඛයේ අරමුණ වන අතර, බුද්ධිමත් ලෙස හා ප්‍රායෝගික ලෙස මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් පිළිපැදීමෙන් මෙම ක්‍රියාවලියට අදාල පාර්ශවයන් මේ වනවිට මුහුණපා ඇති ගැටලු වලට සංවර්ධන විසඳුම් ලබා දීමට ක්‍රියාකරන මෙන් වැඩිදුරටත් උපදෙස් දෙමි.

ඩබ්.එම්.එම්.බී. වීරසේකර
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

ඩබ්.එම්.එම්.බී. වීරසේකර,
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්,
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 42, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

පිටපත්:
1. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය
2. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
3. ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය
4. ලේකම්, පරිසර හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය
5. රාජ්‍ය ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
6. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
7. අධ්‍යක්ෂ ජනරාල්, මහවැලි සංවර්ධන අධිකාරිය
8. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
9. සභාපති, මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
10. සභාපති, මධ්‍යම පරිසර අධිකාරිය
11. සභාපති, ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව
12. සභාපති, භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය
13. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත - මේ සම්බන්ධයෙන් සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීම සඳහා
14. සියලුම පළාත් කෘෂිකර්ම ලේකම්වරුන් වෙත
15. සියලුම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් වෙත
16. සියලුම පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂවරුන් වෙත,
17. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් වෙත
18. සියලුම ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් වෙත

104

ඇමුණුම - 1 (GM-01)

| අනු අංකය | |
|---|---|

**2011 ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 32, 33, 34හා 36යන වගන්ති යටතේ කුඹුරු ඉඩමක මැණික් ගැරීමට අදාල පතල් කැනීම සඳහා අවසර ලබා දීම.**

01. *

I. ඉල්ලුම්කරුගේ නම :..............................................................................................
II. ලිපිනය : ..............................................................................................
III. ජා.හැ.ප. අංකය : ................................... දුරකථන අංකය : .......................................

පහත දැක්වෙන කුඹුරු ඉඩම 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ කොන්දේසි වලට අනුව මැණික් ගැරීමේ කාර්යය සඳහා තාවකාලිකව යෙදවීමට අවසර ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

02. කුඹුරු ඉඩම පිළිබඳ විස්තර

I. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :-..........................................................................
II. කෘ.ප.නි.ස.කොට්ඨාශය :-..........................................................................
III. ග්‍රාම නිලධාරි වසම :- ..........................................................................
IV. කුඹුර පිහිටි ගම :-..........................................................................
V. කුඹුර පිහිටි යාය :-..........................................................................
VI. කුඹුරු ඉඩමේ නම /නම් :-..........................................................................
VII. කුඹුරු ඉඩමේ බිම් ප්‍රමාණය :- අක්:.........රූඩ්:............පර්: ..........(හෙක්ටෙයාර්............)
VIII. කුඹුරු ඉඩමේ හතර මායිම
උතුරට :-.....................................................................
නැගෙනහිරට :- .....................................................................
දකුණට :-.....................................................................
බස්නාහිරට :-.....................................................................
IX. පතල් කැනීමට අවසර ඉල්ලා සිටින බිම් ප්‍රමාණය :- පර්චස් .......................
(කටු සටහන යාකර ඇත)
X. ජල මූලාශ්‍රය :- මහාවාරි/ මධ්‍යම වාරි/ සුළු වාරි/ **මනවාරි
XI. වගා ඉතිහාසය

| වගා කන්නය | වගා කළ බෝගය | ලබා ගත් අස්වැන්න | විශේෂ කරුණු |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

*ඉල්ලුම්කරු අදාල ඉඩමේ නීත්‍යානුකූල අයිතිකරු, බදුකරු හෝ එම ඉඩමේ ඇටෝනි බලය දරන්නා විය යුතුය.

** මනවාරි - අහස්දිය, වගා ළිං, ඇළ මාර්ග, හැල් හා අර්ධ හැල් සහිත බිම් ආදිය

XII. අදාල කුඹුර වගා නොකරන්නේ නම් ඊට බලපෑ හේතු:
a.
b.
c.

XIII. ඉහත හතර මායිම්වලට අමතරව කුඹුර තුල පිහිටි හෝ කුඹුරට සම්බන්ධ ඇළ මාර්ග/ වේලි/ කමත/ කෘෂි පාර හෝ වෙනත් නිර්මිත තිබේ ද යන විග :-
a.
b.
c.

03. අයිතිවාසිකම් පිළිබඳ විස්තර (√):-

(අ) සින්නක්කර ☐ හවුල් (නොබෙදූ) අයිතිකරු ☐ සම්පූර්ණ අයිතිකරු ☐

හවුල් අයිතියක් නම්, - නොබෙදූ පංගුවක් ☐ කට්ටි මාරු ☐

තට්ටු මාරු ☐

(ආ) රාජ්‍ය ප්‍රදාන ☐

(ඇ) බදු දීම ☐

(ඈ) ඉහත හිමිකම් තහවුරු කිරීම සඳහා පහත ලිපි ලේඛන වල පිටපත් අමුණා ඇත.(අංකය සඳහන් කරන්න)

1) ඔප්පු :- ..............................................................
2) බලපත්‍ර:- ..............................................................
3) පිඹුර :- ..............................................................
4) වෙනත් :-..............................................................

04. මෙම කුඹුරු ඉඩම සඳහා අඳ ගොවියකු සිටී නම් අඳ ගොවියාගේ විස්තර
a. නම:- ..............................................................
b. ලිපිනය:- ..............................................................
c. ජා.හැ.ප. අංකය:-..............................................................

05. මැණික් ගැරීම සඳහා මෙම කුඹුර යෙදවීමට අපේක්ෂිත කාලය :- මාස: ....................................
06. අවසර ඉල්ලා සිටින පතල් සංඛ්‍යාව :- ..........................................

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොන්දේසිවලට යටත්ව ක්‍රියාකිරීමට මෙයින් එකඟවෙමි.

.................................................
දිනය

.................................................
අයදුම්කරුගේ අත්සන

**අඳ ගොවියාගේ එකඟතාවය**

ඉහත සඳහන් කුඹුර යෝජිත පරිදි මැණික් පතල් කැනීම සඳහා තාවකාලිකව යෙදවීමට එහි නීත්‍යානුකුල අඳ ගොවියා වශයෙන් මෙයින් එකඟ වෙමි.

............................................... 
දිනය

............................................. 
(අත්සන - රු.20 මුද්දරයක්)
අඳ ගොවියාගේ නම:

**අත්සනට සාක්ෂි**

මෙම ඉඩමේ නීත්‍යානුකුල අඳ ගොවියා වන ................................................... මයා/මිය/මෙය මා ඉදිරිපිටදී ........................................ දින මෙම අයදුම්පතට අත්සන් යොදන ලදී.

............................................... 
දිනය

............................................. 
(අත්සන)
නම:
නිල මුද්‍රාව:

(මෙම අත්සන සහතික කිරීම ගොවිජන සේවා කාරක සභාවේ සාමාජිකයකු, කෘ.ප.නි.ස, ග්‍රාම නිලධාරි හෝ සමාදාන විනිශ්චයකාරවරයකු විසින් සිදුකල යුතුය)

---

**කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරගේ නිර්දේශය**

ඉහත සඳහන් කුඹුරු ඉඩම ........................ දින මවිසින් පරික්ෂා කල අතර, එය ................................වසමේ ........................................ යායේ ................................................ කුඹුරු ඉඩමේ .....................................කෘෂිකාර්මික කුඹුරු ඉඩම් නාම ලේඛනයේ ................................ පිටුවේ ................................ සටහන් අංක යටතේ සටහන්ව ඇත/නැත. ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් තොරතුරු සැසඳේ/නොසැසඳේ.

මෙම ඉඩම මැණික් ගැරීමට අදාල වූ පතල් කැපීම සඳහා පහත සඳහන් කොන්දේසි වලට යටත්ව මෙයින් නිර්දේශ කරමි/ පහත සඳහන් හේතු මත නිර්දේශ නොකරමි.

**කොන්දේසි/හේතු**

1.
2.
3.

............................................... 
දිනය

............................................. 
(අත්සන)

නිල මුද්‍රාව:
කෘ.ප.නි.ස.

## ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී නිර්දේශය

ඉහත සඳහන් කුඹුරු ඉඩම .................................. දින මා විසින් පරික්ෂා කල අතර, ඒ සඳහා රුපියල් ...................................... මුදලක් .................................. දරණ කුවිතාන්සිය යටතේ බලපත්‍රය සඳහා සේවා ගාස්තුව ලෙස ද, රුපියල් ............................................මුදලක් ............................... දරණ කුවිතාන්සිය යටතේ ඇප මුදල් වශයෙන් ද ..............................ගොවිජන සේවා කාරක සභාවට ගෙවා ඇත. ඒ අනුව මෙම කුඹුරු ඉඩම තුල පතල් කැපීමට අවසරය ලබා දීම සුදුසු බව නිර්දේශ කරමි/ නිර්දේශ නොකරමි.

................................................ ..............................................

දිනය (අත්සන)

ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
නිල මුද්‍රාව

## දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරයාගේ අවසරය

නිර්දේශ ඉදිරිපත් කරන ලද නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද කොන්දේසි වලට යටත්ව ඉහත ඉල්ලීම සඳහා අවසර ලබා දීම මෙයින් අනුමත කරමි.

................................................ ..............................................

දිනය (අත්සන)

ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්
නිල මුද්‍රාව

| අනු අංකය | |
|---|---|

**2011 ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 32, 33, 34 හා 36 යන වගන්ති යටතේ කුඹුරු ඉඩමක මැණික් ගැරීමට අදාල පතල් කැනීම සඳහා අවසර ලබා දීම (යාන්ත්‍රික)**

01. *

I. ඉල්ලුම්කරුගේ නම:..........................................................................................

II. ලිපිනය : ..........................................................................................

III. ජා.හැ.ප. අංකය: .................................. දුරකථන අංකය: ......................................

පහත දැක්වෙන කුඹුරු ඉඩම 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ කොන්දේසිවලට අනුව මැණික් ගැරීමේ කාර්යය සඳහා තාවකාලිකව යෙදවීමට අවසර ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

02. කුඹුරු ඉඩම පිළිබඳ විස්තර

I. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :- ..........................................................................

II. ගෘ.ප.නි.ස. කොට්ඨාශය :- ..........................................................................

III. ග්‍රාම නිලධාරී වසම :- ..........................................................................

IV. කුඹුර පිහිටි ගම :- ..........................................................................

V. කුඹුර පිහිටි යාය :- ..........................................................................

VI. කුඹුරු ඉඩමේ නම /නම් :- ..........................................................................

VII. කුඹුරු ඉඩමේ බිම් ප්‍රමාණය :- අක්:.......... රූඩ්:.............පර්: ...........(හෙක්ටෙයාර්......)

VIII. කුඹුරු ඉඩමේ හතර මායිම

උතුරට :- ..........................................................................

නැගෙනහිරට :- ..........................................................................

දකුණට :- ..........................................................................

බස්නාහිරට :- ..........................................................................

IX. පතල් කැනීමට අවසර ඉල්ලා සිටින බිම් ප්‍රමාණය :- පර්චස් ......................
(කටු සටහන යාකර ඇත)

X. ජල මූලාශ්‍රය :- මහාවාරි/ මධ්‍යම වාරි/ සුළු වාරි/ **මනවාරි

XI. වගා ඉතිහාසය

| වගා කන්නය | වගා කළ බෝගය | ලබා ගත් අස්වැන්න | විශේෂ කරුණු |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

* ඉල්ලුම්කරු අදාල ඉඩමේ නීත්‍යානුකූල අයිතිකරු, බදුකරු හෝ එම ඉඩමේ ඇටෝර්නි බලය දරන්නා විය යුතුය.

** මනවාරි - අහස්දිය, වගා ළිං, ඇළ මාර්ග, හැල් හා අර්ධ හැල් සහිත බිම් ආදිය

XII. අදාල කුඹුර වගා නොකරන්නේ නම් ඊට බලපෑ හේතු:

a.
b.
c.

XIII. ඉහත හතර මායිම් වලට අමතරව කුඹුර තුල පිහිටි හෝ කුඹුරට සම්බන්ධ ඇළ මාර්ග/වෙලි/කමත/කෘෂි පාර හෝ වෙනත් නිර්මිත තිබේ ද යන වග :-

a.
b.
c.

03. අයිතිවාසිකම් පිළිබඳ විස්තර (√) :-

(අ) සින්නක්කර ☐ හවුල් (නොබෙදූ) අයිතිකරු ☐ සම්පූර්ණ අයිතිකරු ☐

හවුල් අයිතියක් නම්, - නොබෙදූ පංගුවක් ☐ කට්ටි මාරු ☐

තට්ටු මාරු ☐

(ආ) රාජ්‍ය ප්‍රදාන ☐

(ඇ) බදු දීම් ☐

(ඈ) ඉහත හිමිකම් තහවුරු කිරීම සඳහා පහත ලිපි ලේඛන වල පිටපත් අමුණා ඇත.(අංකය සඳහන් කරන්න)

1) ඔප්පු :- ........................................................................
2) බලපත්‍ර :- ........................................................................
3) පිඹුර :- ........................................................................
4) වෙනත් :- ........................................................................

04. මෙම කුඹුරු ඉඩම සඳහා අඳ ගොවියකු සිටී නම් අඳ ගොවියාගේ විස්තර

I. නම:- ........................................................................................................
II. ලිපිනය:- ...................................................................................................
III. ජා.හැ.ප. අංකය:-.........................................................................................

05. මැණික් ගැරීම සඳහා මෙම කුඹුර යෙදවීමට අපේක්ෂිත කාලය :- මාස: .....................................
06. අවසර ඉල්ලා සිටින පතල් සංඛ්‍යාව :- ..................................................

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොන්දේසිවලට යටත්ව ක්‍රියා කිරීමට මෙයින් එකඟ වෙමි.

................................................ ................................................
දිනය අයදුම්කරුගේ අත්සන

## අඳ ගොවියාගේ එකඟතාවය

ඉහත සඳහන් කුඹුර යෝජිත පරිදි මැණික් පතල් කැනීම සඳහා තාවකාලිකව යෙදවීමට එහි නීත්‍යානුකූල අඳ ගොවියා වශයෙන් මෙයින් එකඟ වෙමි.

.................................................. ..............................................

දිනය (අත්සන - රු.20 මුද්දරයක්)

අඳ ගොවියාගේ නම:

## අත්සනට සාක්ෂි

මෙම ඉඩමේ නීත්‍යානුකූල අඳ ගොවියා වන .................................................. මයා/මිය/මෙය මා ඉදිරිපිටදී .......................................... දින මෙම අයදුම්පතට අත්සන් යොදන ලදී.

.................................................. ..............................................

දිනය (අත්සන)

නම:

නිල මුද්‍රාව:

(මෙම අත්සන සහතික කිරීම ගොවිජන සේවා කාරක සභාවේ සාමාජිකයකු, කෘ.ප.නි.ස, ග්‍රාම නිලධාරි හෝ සමාදාන විනිශ්චයකාරවරයකු විසින් සිදුකල යුතුය)

---

## කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරගේ නිර්දේශය

ඉහත සඳහන් කුඹුරු ඉඩම ......................... දින මවිසින් පරික්ෂා කල අතර, එය .................................වසමේ ........................................... යායේ ................................................ කුඹුරු ඉඩමේ ......................................කෘෂිකාර්මික කුඹුරු ඉඩම් නාම ලේඛනයේ ................................ පිටුවේ ................................ සටහන් අංක යටතේ සටහන්ව ඇත/ නැත. ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් තොරතුරු සැසඳේ/ නොසැසඳේ.

මෙම ඉඩම මැණික් ගැරීමට අදාල වූ පතල් කැපීම සඳහා පහත සඳහන් කොන්දේසි වලට යටත්ව මෙයින් නිර්දේශ කරමි/ පහත සඳහන් හේතු මත නිර්දේශ නොකරමි.

**කොන්දේසි/හේතු**

4.
5.
6.

.................................................. ..............................................

දිනය (අත්සන)

කෘ.ප.නි.ස.

නිල මුද්‍රාව:

## ගොවිජන සේවා කාරක සභාවේ නිර්දේශය

ඉහත සඳහන් කුඹුරු ඉඩම ................................... දින මා විසින් පරික්ෂා කල අතර, ඒ සඳහා රුපියල් ...................................... මුදලක් .................................. දරණ කුවිතාන්සිය යටතේ බලපත්‍රය සඳහා සේවා ගාස්තුව ලෙස ද, රුපියල් ............................................මුදලක් .......................... දරණ කුවිතාන්සිය යටතේ ඇප මුදල් වශයෙන් ද ...........................................ගොවිජන සේවා කාරක සභාවට ගෙවා ඇත. මෙම කුඹුරු ඉඩමේ යන්ත්‍රසූත්‍ර යොදා මැණික් ගැරීම සඳහා අවශ්‍ය පතල් කැපීමට අවසර ලබා දීමට ...................................... දින පැවති ගොවිජන සේවා කාරක සභාවේදී තීරණය කරන ලදී.

...............................................
දිනය

...............................................
(අත්සන)
විධායක ලේකම්
නිල මුද්‍රාව

## තාක්ෂණ නිලධාරී නිර්දේශය

ඉහත සඳහන් කුඹුරු ඉඩම ....................... දින මවිසින් පරික්ෂා කල අතර, එම ඉඩමේ තාවකාලිකව මැණික් ගැරීමට අදාල පතල් කැපීම සඳහා අවසර ලබා දීමට පහත සඳහන් කොන්දේසි වලට යටත්ව නිර්දේශ කරමි./ පහත සඳහන් හේතු මත නිර්දේශ නොකරමි.

**කොන්දේසි/හේතු**

1.
2.
3.

...............................................
දිනය

...............................................
තාක්ෂණ නිලධාරී
නිල මුද්‍රාව

## දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරයාගේ අවසරය

නිර්දේශ ඉදිරිපත් කරන ලද නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද කොන්දේසි වලට යටත්ව ඉහත ඉල්ලීම සඳහා අවසර ලබා දීම මෙයින් අනුමත කරමි.

...............................................
දිනය

...............................................
(අත්සන)
ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්
නිල මුද්‍රාව

මගේ අංකය:-
ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය
.....................................
2018.

........................................................ මයා/මිය/මෙනවිය
........................................................
........................................................

**<u>2011 ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 32,33,34 හා36 වගන්ති යටතේ කුඹුරු ඉඩම්වල ඛණිජ සම්පත් ලබා ගැනීමේ (මැණික් ගැරීම සඳහා පතල් කැපීම) කාර්යය වෙනුවෙන් කුඹුරු ඉඩම් යොදා ගැනීම සඳහා අවසරය ලබා දීම.</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් .................................. දාතමින් ඉදිරිපත් කරන ලද අයදුම්පත (අනු අංකය- ) හා බැඳේ.

පහත සඳහන් කොන්දේසි වලට යටත්ව ඔබගේ ඉල්ලීම සඳහා මේ මගින් අවසර ලබා දෙමි/ පහත සඳහන් හේතු මත අවසර ලබා දීම ප්‍රතික්ෂේප කරමි.

<u>කුඹුරු ඉඩම පිළිබඳ තොරතුරු</u>

I. දිස්ත්‍රික්කය :-.................................................
II. ගොවිජන සේවා බල ප්‍රදේශය :-.................................................
III. කෘ.ප.නි.ස. වසම :-.................................................
IV. ග්‍රා.නි. වසම :-.................................................
V. ගම :-.................................................
VI. යාය :-.................................................
VII. ඉඩමේ නම :-.................................................
VIII. පිඹුරේ අංකය :-.................................................
IX. මිනින්දෝරු තැනගේ නම :-.................................................
X. මායිම්

උතුර :-.................................................
නැගෙනහිර :-.................................................
දකුණ :-.................................................
බස්නාහිර :-.................................................

අවසර ලබාදෙන කාලය: ..........................දින සිට .................... දින දක්වා
අවසර ලබාදෙන බිම් ප්‍රමාණය : අක් ................. රූඩ් ................... පර්චස් ............
අනුමත පතල් සංඛ්‍යාව :

කොන්දේසි/හේතු

I.
II.
III.
IV.

මෙම අවසර පත්‍රයේ සඳහන් කොන්දේසි කඩකලහොත් හෝ අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු හෝ නිර්දේශ ඉදිරිපත් කරන ලද නිලධාරින් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු සාවද්‍ය බව පෙනීගිය හොත් ඕනෑම අවස්ථාවකදී මෙම අවසරය අවලංගු කල හැකි බව හා ඒ නිසා අයදුම්කරුවන්ට සිදුවන අලාභය පිළිබඳව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගකීමට බැඳී නොමැති බව ද වැඩිදුරටත් සඳහන් කරමි.

දිනය: .............................

...............................................................
(අත්සන)
ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්
නිල මුද්‍රාව

පිටපත්

I. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්
කොළඹ
II. සාමාන්‍යාධිකාරී
මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී
III. ප්‍රාදේශීයලේකම්,
................................
IV. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
......................................................
V. කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර
...................................
VI. ..................................... ගොවි සංවිධානය
...................................